# කළුතර, මානව ජනාවාසවීමේ වර්ධනය සහ පරිණාමීය අවස්ථාවන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ.ජී.එච්. රන්දික

පුරාවිද්‍යා හා උරුම කළමණාකරන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
hasithrandika1998@gmail.com

**මුඛ්‍ය පද** - කළුතර, කළු ගඟ, ජනාවාසකරණය වීම, පස් යොදුන් රට

## හැඳින්වීම

ඉතා දීර්ඝ වූ මානව ඉතිහාසයක් හිමි බව පුරාවිද්‍යාත්මකව තහවුරු වන දිවයිනක් ලෙස ශ්‍රී ලංකාව වැදගත් වේ. මෙරට තෙත් හා වියළි කළාපීය මානව ජනාවාස වීම විවිධ පර්යේෂකයන් විසින් පර්යේෂණයට ලක්කර ඇත. කළුතර, නූතන පරිපාලන බෙදීම් අනුව බස්නාහිර පළාතට අයත් වර්ග කිලෝමීටර් 1598ක් වූ දිස්ත්‍රික්කයකි. මෙම භූමිභාගය මානව ජනාවාසකරණය වී අද වන විට ඉතා දීර්ඝ කාලයක් ගෙවී ඇත. කොතරම් දීර්ඝ කාලයක් ද විමසුවහොත් මෙරට පැරණිතම ජනාවාසයක් ලෙස ද කළුතර හඳුනාගත හැක. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව මෙරට මානව ජනාවාසකරණය තුළ වඩාත් දීර්ඝ ඉතිහාසයක් පවතින භූමි භාගයක් ලෙසට කළුතර දිස්ත්‍රික්කය ගත හැකි ද යන්න විමසීමයි. මෙහි පර්යේෂණ අරමුණ වන්නේ කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමානය තෙක් මානව ජනාවාසකරණය සිදු වූ අයුරු විමසීමයි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී ක්ෂේත්‍ර ගවේෂණය මෙන්ම සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ද සිදුකරන ලදි. ක්ෂේත්‍ර නොවන ගවේෂණය ද සිදු කළ අතර ඒ යටතේ සාහිත්‍යමය මූලාශ්‍ර ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර රැසක් පරිශීලනය මෙන්ම අන්තර්ජාල පරිශීලනය ද සිදු කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

කළුතර ප්‍රදේශය අතීතයේ දී පස් යොදුන් රට ලෙස හඳුන්වනු ලැබීය. පස් යොදුන් රට, පස් යොත්ත, පංචයෝජන රට්ඨ නාමයන් වෙනස් වී කළුතර යන නාමය මෙම භූමිය පෝෂණය කරමින් ගලා බසින කළු ගඟ හේතු කොටගෙන නිර්මාණය වූ බව මතයකි. එසේම කාළතිත්ථ ලෙස අප හැඳින් වූ කළුගං මුවදොර පිහිටි තොටුපල හේතුවෙන් මෙම නාමය ලැබුණු බවද, "පලාතොට" පසු කලෙක කළුතර වූ බවද මතයන් වේ. කළුතර ජනාවාස වීම් පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී, ව්‍යාකරණ ග්‍රන්ථයක් වශයෙන් වැදගත් වන්නා වූ සිදත් සඟරාව රචනා වූයේ ද හොරණ රජ මහා විහාරයේ යැයි පිළිගැනීම තුළ කළුතර ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් අනාවරණය කර ගැනීමේ හැකියාව පවතී. එසේම පොළොන්නරුවේ වික්‍රමබාහු සමඟ යුධ වැදී, පැරදී, මිත්තාගේ පුතුන් පැන ගොස් සැඟවුනේ ද පවුර කන්ද විහාරය පිහිටි කඳු ශිඛරයේ බව ජනප්‍රවාදයේ එයි. ඒ ආශ්‍රිත ප්‍රදේශය ජනාවාස වීමෙහි ලා එම සිදුවීම හා කෝට්ටේ යුගයේ දී වීදිය බණ්ඩාරගේ පාලනය බලපෑ බව අදටත් එම ප්‍රදේශවාසීන් පිළිගනී.

කළුතර පිළිබඳ පවතින ජනප්‍රවාද තුළින් ජනාවාස වීම් පිළිබඳ විමසීමේ දී, සාහිත්‍ය මූලාශ්‍රවල දෙවන පෑතිස් රජ අවධියේ සිදු වූ දෙතිස් ඵල බෝ රුක්ෂ පිළිබඳ කථා පුවතේ එක් රුකක් කළුතර පිහිට වූ බවත් ඒ ඇසතු වෘක්ෂය කළුතර උඩමළුවේ පිහිටි බෝධිය ලෙසත් සලකයි. මෙය ක්‍රි.පූ. 3 සියවස වනවිට, අනුරාධපුර රාජධානි සමය වන විට මෙම ප්‍රදේශයේ ජනාවාස වීම පිළිබඳ සාක්ෂි සැපයීමකි. කිත්සිරිමෙවන් රජ දවස කළ පොකුණුවිට විහාර ඉතිහාසය ද මෙම කරුණ සපත කරන සාක්ෂි ගෙන එනු පෙනෙයි. මීට අමතරව වත්මන් පරිපාලන බෙදීම් අනුව වත්මන් කළුතරට අයත් නොවන බෙන්තර ගලපාත විහාරය ආශ්‍රිත ඉතිහාසය ද අනුරපුර දුටුගැමුණු හා සද්ධාතිස්ස රජුන් දවසට දිවෙයි. එසේම පොළොන්නරු යුගයේ සිට සීතාවක අවධිය තෙක් ලංකාව එක්සේසත් කළ පාලකයින් තිදෙනෙක්ද ඇතුළුව

ප්‍රාදේශීය පාලකයින් රැසක් මෙම කළුතර මුල් කර පාළනය ගෙන ගොස් ඇත. චූල වංශයේ එන පළමු විජයබාහු අවධියේ පොළොන්නරු යුගයේ ප්‍රබල මධ්‍යස්ථානයක් වූ " හිරණ්‍යමලය" ලෙස දක්වා ඇත්තේ හොරණ ප්‍රදේශයයි. කළුතර භූමි භාගය පාලනය කළ ප්‍රධානීන් විමසීමේ දී මහා විජයබාහු, මානාභරණ, කීර්ති ශ්‍රී මේඝ, පළමු පරාක්‍රමබාහු, තිස්සමාරණාවන්, කේශධාතුලෝක, කේශධාතු දේවරාජ, කහම්බල්කුළුම්න්දල්නා, දෙවන පැරකුම්, දේව පතිරාජ, ප්‍රභූරාජ අලගක්කෝණාර, කුමාර අලකේශ්වර, හයවන පරාක්‍රමබාහු, අගලවත්තේ කැකුළන්දොළ ශ්‍රී වර්ධනපතිරාජ, වීදාගම මහා මෛත්‍රී හිමි, රයිගම් බන්ඩාර, මායාදුන්නේ, වීදිය බන්ඩාර, පළමු වන රාජසිංහ ආදී ලෙස පාලකයින් පෙල ගැස්විය හැක. කළුතර දිස්ත්‍රික්කයේ ඓතිහාසික ජනාවාස වීම පිළිබඳ විමසීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ද ඉතා වැදගත් වේ. නැගෙනහිර පස් යොදුන් කෝරලයේ බුලත්සිංහල යටගම්පිටිය ප්‍රදේශයේ අඩි 468ක් පමණ උස ගල් පර්වතයක පිහිටි පාහියංගල පුරාවිද්‍යාත්මක භූමිය මෙරට ඉතිහාසයේ සංධිස්තානයක් වූවක් ලෙස සැලකිය හැක. මෙරට ප්‍රාග් ඉතිහාසය පිළිබඳ පැරණිම සාක්ෂි ගෙන එන පාහියංගල, හෝමෝ සේපියන් හෙවත් නූතන මානවයාගේ ජනාවාස ගත වීම මෙරට දී පමණක් නොව දකුණු ආසියානු කළාපයේ ම පුරාවිද්‍යාත්මකව කළුතර දිස්ත්‍රික්කය මුල් කර ගනිමින් මතුවී ඇති බව අදින් වසර 48,000ක පමණ වූ පුරාවිද්‍යාත්මක කාළනීර්ණ මගින් පුරාවිද්‍යාඥයින් විසින් පෙන්වා දෙයි. කළුතර ආශ්‍රිත පූර්ව ඓතිහාසික ජනාවාස වීම පිළිබඳ දූවේගම පැලැල්වත්ත ප්‍රදේශයෙන් හමුවන බරණි සුසානයන් සනාථ කරන බව පෙනේ. අතීතයේ පැරණි විහාරස්ථාන පැවති පෙදෙස් ජනාවාස ගොඩනැගී තිබූ ස්ථාන බව අප දනිමු. හොරණ රජමහා විහාරයෙන් හමුවන වජ්‍රාසනය අනුරපුර තෙක් ඉතිහාසයක ජනාවාස වූ ජනතාවක් සිටි බව හෙලි කරන තවත් එවන් වූ පුරාවිද්‍යාත්මක සාධකයක් යැයි සනාථ වී ඇත.

කළුතර ඉතිහාසය පිළිබඳ විමසීමේ දී වැදගත් වන ක්‍රි.ව. 1වන සියවස සිට ක්‍රි.ව. 16වන සියවස දක්වා දිවෙන ශිලා ලේඛණ කිහිපයකි. ඒ අතර දියගම ගිරි ලිපිය, බණ්ඩාරගම රඹුක්කන රජමහා විහාර ලිපිය, පොකුණුවිට රජමහා විහාර ලිපිය, වැල්මිල්ල ටැම් ලිපිය, ගලපාත විහාර ලිපිය, ගණේකන්ද පර්වත ලිපිය, කළුතර ද්‍රවිඩ ලිපිය, ගණේ උඩ පුවරු ලිපිය, කිතුල්ගොඩ ගණේගොඩැල්ල ලිපිය, ගැළණිගම පුවරු ලිපිය, ගොරකාන පුවරු හා ටැම් ලිපි, පදුමාරාම පුවරු ලිපිය, අගලවත්ත පතිරාජ පිරිවෙන් ටැම් ලිපිය, වලල්ලාවිට තොටහ ලිපිය, ආදිය එයට නිදසුන් වේ. යම් පාලකයෙකු සෙල්ලිපි පිහිටුවන්නේ ජනයා නිතර ගැවසෙන ස්ථානයක බව අප දනිමු. ඒ අනුව මෙම ලිපි තත්කාලීනව ප්‍රදේශයේ ජනාවාස වීම පිළිබඳ වඩාත් විශ්වාසනීය සාක්ෂි සපයන මූලාශ්‍ර ලෙස අපට හඳුනා ගත හැක. මෙහි දී දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ගිරි, ටැම්, පුවරු ලිපි හමුවුව ද ලෙන් ලිපි පැරණි හෝ නූතන පරිපාලන බෙදීම් අනුව මෙම ප්‍රදේශය ආශ්‍රිතව වාර්ථා නොවීම යි.

කළුතර ආශ්‍රිතව යටත් විජිත අවධියේ විවිධ දේවස්ථාන බිහිවීම, වෙළෙඳාමෙහි ඇති වූ දියුණුව ද මුහුදුබඩ ප්‍රදේශ ජනාවාසකරණය වීමට බලපෑ බව පෙනීයයි. රිච්මන්ඩ් කාසල් වැනි ගොඩනැගිලි වෙනස්ම යුරෝපීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පෙන්වයි. මේ අනුව කළුතර යනු මෙරට නූතන මානව ජනාවාසකරණයේ පැරණිම ජනාවාස අතරින් විශේෂ වන භූමියක් බව ඉහත කරුණු මත පෙනී යයි. මධ්‍යශිලා අවධියේ ප්ලයිස්ටෝසීන යුගයේ සිට වත්මන් හොලෝසීන අවධිය තෙක් පැවත ආ කළුතර ලංකාවේ සරුසාරම භූමි භාගයක් ලෙසත්, සංස්කෘතික භූ දර්ශනයේ ඉතා වැදගත් ස්ථානයක් ලෙසත් හඳුනාගත හැක.

**ආශ්‍රිත මූලාශ්‍රය**

***මහාවංසය සිංහල***, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සෝමදේව, ආර්. (2015)ල ***පස් යොදුන් රට ඓතිහාසික පසුබිම,*** කළුතොට ශාස්ත්‍රීය සංග්‍රහය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.